**සී/ස මහවැලි පශු සම්පත් හා කෘෂි ව්‍යාපාරික (පුද්ගලික) සමාගම - 2023**

---

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

සී/ස මහවැලි පශු සම්පත් හා කෘෂි ව්‍යාපාරික (පුද්ගලික) සමාගමේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරුද ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන් වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළයුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, සමාගමේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සඳහා වූ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායයන් සඳහා වූ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, සමාගම අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය සමාගම ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සමාගමේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

සමාගමේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරික්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, සමාගමේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂයය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් , චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද ,අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සමාගමේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළයුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළයුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත්වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ සමාගමේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ සමාගමේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, සමාගම ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

**1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ**

**1.5.1 කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායයන් සඳහා වූ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම**

| | අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ගිරාඳුරුකෝට්ටේ ගොවිපලෙහි අක්කර 1,113 රූඩ් 0 පර්චස් 37.76 ක ඉඩම සහ දම්මින්න ගොවිපළෙහි අක්කර 100 ක ඉඩම සමාගම විසින් භාවිතා කරමින් තිබුණද, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායයන් සඳහා වූ ගිණුම්කරණ ප්‍රමිති 17.04 ඡේදය අනුව එම ඉඩම්වල වටිනාකම් ගිණුම්වලට ගෙන නොතිබුණි. | සමාගමේ වත්කම් ලෙස ඉඩම් තක්සේරු කර ගිණුම්ගත කර නොමැත. සමාගම වෙත ඉඩම් පැවරීමක් සිදු කර නොමැත. | ගිණුම්කරණ ප්‍රමිතිය ප්‍රකාරව ඉඩම්වල වටිනාකම් තක්සේරු කර ගිණුම්වලට ගත යුතුය. |
| (ආ) | ඉකුත් වර්ෂයක සිදු කර තිබුණු කාර්යාල උපකරණ, වාහන හා යන්ත්‍ර සූත්‍ර ප්‍රත්‍යාගණනය හේතුවෙන් ඇති වූ රු.640,000 ක ලාභයක් සමාලෝචිත වර්ෂයේ ගිණුම්ගත කර තිබුණද, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන් සඳහා වූ ගිණුම්කරණ ප්‍රමිතියේ 17 ඡේදය ප්‍රකාර සිදු කළ යුතු හෙළිදරව් කිරීම් සිදු කර නොතිබුණි. | ප්‍රත්‍යයගණන අගයද (Additions) එකතු කිරීම යටතට ගෙන දක්වා ඇත. එය වෙන්කර Additions හා Re valuations ලෙස දක්වා නිවැරදි කරන ලද ලේඛනය ඇත. | ගිණුම්කරණ ප්‍රමිතිය ප්‍රකාරව හෙළිදරව් කළ යුතුය. |
| (ඇ) | පූර්ව වර්ෂ සඳහා වූ ගැලපුම් ලෙස රු.814,905 ක් අයභාර සංචිතයෙන් අඩු කර රු.1,274,358ක් එකතු කර තිබුණද, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායයන් සඳහා වූ ගිණුම්කරණ ප්‍රමිති 10.23 අනුව ඊට අදාළ හෙළිදරව් කිරීම සිදුකර නොතිබුණි. | ඉදිරියේදී නිවැරදි කරමි. | ගිණුම්කරණ ප්‍රමිතිය ප්‍රකාරව ප්‍රවර්තන ගැලපුම් හෙළිදරව් කළ යුතුය. |
| (ඈ) | කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායයන් සඳහා වූ ගිණුම්කරණ ප්‍රමිති 28.18 අනුව පාරිතෝෂික ගණනයේදී ආයුගණක අගය කිරීම් ක්‍රමය පදනම් කරගෙන පාරිතෝෂික වගකීම ගණනය කර ලාභය හෝ අලාභය මූල්‍ය ප්‍රකාශවලට ගැලපිය යුතු වුවද, සමාගම ඊට අනුකූලවී නොතිබුණි.තවද, සේවා කාලය වර්ෂ 01ත්-05ත් අතර වන සේවකයන් 07 දෙනෙකු සඳහා කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන් සඳහා වූ ගිණුම්කරණ ප්‍රමිති 28 අනුව රු.228,662 ක් වූ පාරිතෝෂික වගකීම ගිණුම්ගත කර නොතිබුණි. | ඉදිරියේදී නිවැරදි කරන බව දන්වා සිටිමි. | ගිණුම්කරණ ප්‍රමිතිය ප්‍රකාරව ආයුගණක අගය කිරීම් ක්‍රමය පදනම් කරගෙන පාරිතෝෂික වගකීම ගණනය කර ගිණුම්ගත කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඉ) | වාණිජ දැව වශයෙන් අලෙවි කිරීමට නිර්දේශ කර තිබූ දම්මින්න ගොවිපලෙහි තේක්ක ගස් 195ක් හා ගිරාඳුරුකෝට්ටේ ගොවිපලෙහි තේක්ක ගස් 211ක් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අංක 41හි 10 ඡේදය අනුව තක්සේරු කර ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි. | ගිරාඳුරුකෝට්ටේ ගොවිපලේ තේක්ක ගස් 211 ක් හා දම්මින්න ගොවිපලේ තේක්ක ගස් 195 ක් හඳුනාගෙන ලේඛන ගතකර ඇත. මේ සම්බන්ධයෙන් අධ්‍යක්ෂක මණ්ඩල පත්‍රිකාවක් ඉදිරිපත් කර අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පත් කරනු ලබන කමිටුවක් මගින් මෙම ගස් තක්සේරු කර එම වටිනාකම 2024 වර්ෂයේ ගිණුම් ගත කිරීමට කටයුතු කරන බව දන්වා සිටිමි | ගිණුම්කරණ ප්‍රමිතිය ප්‍රකාරව මෙම ගස් තක්සේරු කර එම වටිනාකම ගිණුම් ගත කළ යුතුය. |

### 1.5.2 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | මුදල් ප්‍රවාහ ප්‍රකාශය තුල රු.1,154,681 ක් වූ තොග වෙනස හා රු.1,113,911ක් වූ පාරිතෝෂික ගෙවීම් ගලපා නොතිබුණි. රු.383,670ක් වූ වෙළඳ හා අනෙකුත් ගෙවිය යුතු ශේෂ වැඩි වීම මුදල් ගලා ඒමක් ලෙස දැක්විය යුතු වුවද එය රු.1,916,226ක මුදල් ගලා යාමක් ලෙස දක්වා තිබුණි. ආයෝජන ක්‍රියාකාරකම් යටතේ රු.155,172ක දේපල පිරියත හා උපකරණ අත්පත් කර ගැනීමක් මුදල් ගලා ඒමක් ලෙස දක්වා තිබුණද එහි රු.903,614ක මුදල් ගලා යාමක් විය. මුදල් ප්‍රවාහ ප්‍රකාශයට නොගැලපිය යුතු රු.459,454ක පූර්ව වර්ෂ ගැලපුම් කාරක ප්‍රාග්ධන වෙනස්වීමක් ලෙස දක්වා තිබුණි. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරමි. | ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මුදල් ප්‍රවාහ ප්‍රකාශය පිළියෙල කළ යුතුය. |
| (ආ) | සමාගම සතුව පැවතුණු තඹුත්තේගම පිහිටි නිරාවිය ගොවිපොළ, කන්තලේ ගොවිපොළ, පොළොන්නරුව පිහිටි සිද්ධපුර ගොවිපොළ, හා වැලිකන්ද පිහිටි මුතුවැල්ල ගොවිපොළ වර්ෂ 2005-2010 අතර කාලපරිච්ඡේදය තුළ විධිමත් ලිඛිත ලේඛන හුවමාරුවකින් තොරව මහවැලි අධිකාරිය වෙත පවරා දී තිබුණි. එම ගොවිපොළවල් සතු පිරිවැය රු.22,336,573 ක් වූ ගොඩනැගිලි හා සවිකිරීම්, වාහන 26 ක්, කාර්යාල උපකරණ 45 ක්, යන්ත්‍රෝපකරණ 63 ක්, ජෙනරේටර් 03 ක් සහ ලීබඩු හා සවිකිරීම් 260 ක් සමාගම විසින් භාවිතා නොකරන නමුත්, සමාගමේ ගිණුම්වල ඇතුළත් කර තිබුණි. තවද එම වත්කම් ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය හෝ සමාගම විසින් භෞතිකව සමීක්ෂණය කර නොතිබුණි. | සමාගමේ පාලනයෙන් ඉවත් වී ඇති පහත සඳහන් ගොවිපළවල්, නිරාවිය, කන්තලේ, සිද්ධපුර, මුතුවැල්ල, තුංකම යන ගොවිපළවල්වල වත්කම් 2024 වර්ෂයට සමාගම මගින් භෞතික සත්‍යාපනය කිරීමට අධ්‍යක්ෂක මණ්ඩල පත්‍රිකාවක් ඉදිරිපත් කර සත්‍යාපන කමිටුවක් නම්කර එම කමිටුවට ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ සාමාජිකයෙකුද ඇතුළත් කර මෙම කාර්ය නිවැරදි කිරීමට කටයුතු කරන බව දන්වා සිටිමි. | සමාගමට අයත් වත්කම් පමණක් ගිණුම් තැබීමට කටයුතුකළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | 2013 ජනවාරි සිට 2023 දෙසැම්බර් දක්වා මාස 110 ක කාලයක් සඳහා සේවක අර්ථසාධක අරමුදල වෙත ගෙවිය යුතු රු. 25,840,605 ක දායක මුදලක් විගණිත දිනය වූ 2024 අප්‍රේල් 04 වනවිටත් ගෙවා නොතිබූ අතර, ඊට අදාළව ගෙවිය යුතු රු.6,208,029ක් වූ අධිභාර ගිණුම්ගත කර නොතිබුණි. | සේවක අර්ථ සාධක සඳහා ගෙවිය යුතු අධිභාර 2024 වර්ෂයේ ගිණුම්ගත කරනු ලැබේ | සියළු වගකීම් හඳුනාගෙන ගිණුම්ගත කළ යුතුය. |
| (ඈ) | 2020 ජුලි සිට 2023 දෙසැම්බර් දක්වා මාස 42 ක කාලයක් සඳහා සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදල වෙත ගෙවිය යුතු රු. 1,345,988 ක දායක මුදල ගෙවා නොතිබූ අතර, ඊට අදාළව ගෙවිය යුතු රු.652,809 ක් වූ අධිභාර, ගිණුම්ගත කර නොතිබුණි. | සේවක භාරකාර අරමුදල් සඳහා ගෙවිය යුතු අධිභාර 2024 වර්ෂයේ ගිණුම් ගතකරනු ලැබේ. | සියළු වගකීම් හඳුනාගෙන ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඉ) | අබලි ද්‍රව්‍ය ඉවත් කිරීමෙන් ලද රු.502,203 ක පාඩුව ලාභාලාභ ගිණුමට ගැලපීම වෙනුවට ප්‍රත්‍යාගණන ලාභයට හර කර තිබුණි. | අබලි ද්‍රව්‍ය ප්‍රත්‍යාගණන ගිණුමට ගැළපීම් නිවැරදි කරමි. | ගිණුම්කරණ වරද නිවැරදි කළ යුතුය. |
| (ඊ) | නිරාවිය ගොවිපලේ සේවකයන් 06 දෙනෙකුට අදාලව රු. 1,729,889ක හිඟ සේවක අර්ථසාධක අරමුදල් දායක මුදල් හා රු.864,945ක අධිභාර මුදල් නොගෙවා පැහැරහැර තිබූ අතර 2023 දෙසැම්බර් 31 දිනට එම හිඟ මුදලෙන් කොටසක් වන රු.402,513 ක දායක මුදල සහ අධිභාර ගිණුම්වල දක්වා නොතිබුණි. | ගෙවිය යුතු සේවක අර්ථසාධක අරමුදල් පිළිබඳ තොරතුරු සමාගම විසින් කාලසීමකට ආදාලව සිදුකරන ලද ගෙවීම් පිලිබඳ කරුණු උසාවියට ඉදිරිපත් කිරීමෙන් අනතුරුව රු. 2,030,402.30 දක්වා ගෙවිය යුතු ශේෂය අඩු වූ අතර එම ශේෂය රු. 50,000 වාරික වලින් ගෙවීමට තීන්දුව ලබා දෙන ලදි. | සියළු වගකීම් ගිණුම්ගත කළ යුතුය. |
| (උ) | වර්ෂ 05 ඉක්මවූ නොගෙවන ලද එකතු කල අගය මත බදු, පිරිවැටුම් බදු හා ජාතිය ගොඩනැගීමේ බදු වලට අදාල ගෙවිය යුතු දඩ මුදල වන රු.1,797,312 ක් ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි. | ශේෂය තහවුරු කිරීම් සාක්ෂි ඉදිරිපත් කර ඇත. | ව්‍යවස්ථාපිත වගකීම් නිරවුල් කිරීමට හා ගිණුම්ගත කළ යුතුය. |
| (ඌ) | 2019 වර්ෂයේ වත්කම් ප්‍රත්‍යාගණනය කිරීමේදී ජනිත වූ රු.213,480ක ප්‍රත්‍යාගණන ලාභය ප්‍රාග්ධන සංචිතයට නොගලපා ආදායම් සංචිතයට ගලපා තිබුණි. | 2019 වර්ෂයේ ප්‍රත්‍යයගණන ලාභයේ වරද නිවැරදි කිරීම 2024 වර්ෂයේ ගිණුම්වලින් සිදු කරමි. | ප්‍රත්‍යාගණන ලාභය නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |
| (එ) | වර්ෂයේ ආදායම් වියදම් නිවැරදිව හඳුනාගැනීම වෙනුවට පූර්ව වර්ෂ මූල්‍ය ප්‍රතිඵලයට ගැලපීම් සිදු කිරීම සමාගම විසින් දිගින් දිගටම සිදුකර තිබීම හේතුවෙන් 2020, 2021 හා 2022 වර්ෂවල විගණිත මූල්‍ය ප්‍රකාශනවල පැවති පිළිවෙලින් රු.5,793,005 ක් හා රු.1,325,555 ක් වූ අලාභ සහ රු.167,815ක ලාභය සඳහා පසු වර්ෂයේදී රු.5,933,003ක, රු.3,376,919ක හා | 2024 වර්ෂයේ ලාභාලාභ ගිණුමේ සටහනක් ලෙස දක්වන බව දන්වා සිටිමි. | උපචිත පදනම මත වර්ෂයේ ආදායම් වියදම් නිවැරදිව හඳුනා ගැනීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | රු.2,089,263 ක පූර්ව වර්ෂ ගැලපීම් සිදු කර තිබුණි. මේ හේතුවෙන් පසු වර්ෂයේදී පිළිවෙලින් රු.7,987,195 ක, රු.1,695,098 ක හා රු.291,639 ක අලාභ දක්වා මූල්‍ය ප්‍රතිඵලය සියයට 28 සිට සියයට 274 දක්වා වර්ධනය වී තිබුණි. | | |
| (ඒ) | 2020 පෙබරවාරි මස සේවයෙන් ඉවත් වූ සේවකයන් තිදෙනෙකුට අදාලව ගෙවිය යුතු රු. 842,668 ක් වූ පාරිතෝෂික ගෙවිය යුතු ශේෂයක් ලෙස දැක්වීම වෙනුවට පාරිතෝෂික වෙන් කිරීම් යටතේ දක්වා තිබුණු අතර එම හිඟ මුදල සමඟ ගෙවිය යුතු අධිභාර රු.252,800 ගිණුම්ගත කර නොතිබුණි. | ගෙවියයුතු පාරිතෝෂික අධිභාරයන් ගිණුම්ගත කිරීම. 2024 වර්ෂයේ අවසාන ගිණුමට ගිණුම්ගත කරමි. | ගෙවිය යුතු පාරිතෝෂික වගකීම නිවැරදිව හදුනාගෙන ගිණුම්ගත කළ යුතුය. |
| (ඔ) | කිරි නිෂ්පාදනයේදී අතුරුඵලයක් ලෙස නිපදවෙන මේදය, අයිස්ක්‍රීම් හා එළගිතෙල් නිෂ්පාදනයේ ප්‍රධාන අමුද්‍රව්‍යයක් ලෙස භාවිතා කර තිබූ අතර, අයිස්ක්‍රීම් හා එළගිතෙල් නිෂ්පාදන පිරිවැය ගණනය කිරීමේදී යොදා ගන්නා එම මේදයෙහි වටිනාකම ගණනය කිරීම සඳහා සම්මත මිලක් යොදාගෙන තිබුණි. ඒකක මිල රු.100ක්ව පැවති එම ඒකක සම්මත මිල 2022 අගෝස්තු සිට රු.400ක් ලෙස වැඩි කර තිබුණි. මෙම ඒකක සම්මත මිල යොදා ගැනීමේදී පදනම් කරගත් කරුණු, අනුමැතිය හා එය වැඩි කිරීම හේතුවෙන් වන බලපෑම පිළිබඳව ගිණුම්වල හෙළිදරව් කර නොතිබුණි. | ඉදිරියේදී අවශ්‍ය අනුමැතිය ලබා ගැනීමට හා ගිණුම්වල අදාළ හෙළිදරව් කිරීමට අවශ්‍ය කටයුතු කරමි. | සම්මත මිල වෙනස් කිරීමේදී අවශ්‍ය අනුමැතිය ලබා ගැනීම හා ගිණුම්වල හෙළිදරව් කිරීම කළ යුතුය. |

## 1.5.3 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

| | විෂයය | මුදල රු. | නොසැපයූ විගණන සාක්ෂි | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|---|
| (අ) | පොදු සංචිතය | | | | |
| (i) | මහවැලි ආර්ථික ඒජන්සිය | 388,362,322 | ප්‍රමාණවත් විස්තර | මෙම ශේෂයන් 2009 වර්ෂයේ පශු සම්පත් සංවර්ධන අංශයේ අවසාන ගිණුම්වල පැවැති ශේෂයන් වන අතර මෙම ශේෂ තහවුරු කිරීමට අදාළ ලේඛන සමාගම සතුව නොමැත. මේ සම්බන්ධව අධ්‍යක්ෂ පත්‍රිකාවක් ඉදිරිපත් කර ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය වෙත මේ සම්බන්ධයෙන් තහවුරු කිරීම් ලබා ගැනීමට උත්සහ කරන බව දන්වමි. | ශේෂ සනාථයන් ලබා ගත යුතුය. |
| (ii) | කොත්මලේ කිරි සංවර්ධන අරමුදල | 2,900,000 | | | |
| (iii) | යුරෝපා ආර්ථික කොමිසමේ ප්‍රාග්ධන ප්‍රදාන | 3,583,706 | | | |
| (iv) | විදේශ ආධාර | 5,729,782 | | | |
| (ආ) | ප්‍රාග්ධන සංචිත | 5,271,743 | | | |

## 1.6 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්

### 1.6.1 ලැබිය යුතු මුදල්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාගමේ මූල්‍ය ප්‍රකාශන අනුව ශ්‍රී ලංකා මහවැලි අධිකාරියෙන් සමාගමට ලැබිය යුතු ශේෂය රු.5,820,430 ක් වුවද අධිකාරියේ මූල්‍ය ප්‍රකාශන අනුව අධිකාරිය විසින් සමාගමට ගෙවිය යුතු ශේෂය රු.12,710,820 ක් වීමෙන් ශේෂ අතර රු.6,890,390 ක වෙනසක් විය. | ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය වෙත ගෙවිය යුතු කිසිදු ශේෂයක් නොමැති බව සහතික කරමි.<br>ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය මගින් ලැබිය යුතු ශේෂයේ වෙනස ලෙස දක්වා ඇති රු. 446,460 ශේෂය ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය වෙත නිරාවිය ගොවිපළ භාර ගත් දින 2010.09.30 වන විට ගොවිපල සතුව තිබූ නිෂ්පාදන හා අමුද්‍රව්‍ය තොගයේ වටිනාකම බව සහතික කරමි. | ලැබිය යුතු මුදල් ලබා ගැනීමට කටයුතු කළ යුතුය. |

## 1.7 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | 2017 අංක 24 දරන දේශීය ආදායම් පනතේ 2(1) හා 102 වගන්ති | සමාගම ආදායම් බදු සඳහා ලියාපදිංචි වීමට හෝ බදු නිදහස් කර ගැනීමට කටයුතු කර නොතිබුණි. | 2024 වර්ෂයේදී මේ සඳහා අවධානය යොමු කරමි. | ආදායම් බදු සඳහා ලියාපදිංචි වීමට හෝ බදු නිදහස් කර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | 1983 අංක 12 දරන පාරිතෝෂික ගෙවීම් පනතේ II කොටසේ 5 (1) වගන්තිය | 2020 පෙබරවාරි මස සේවයෙන් ඉවත් වූ සේවකයන් තිදෙනෙකු වෙත ගෙවිය යුතු වූ රු.842,668ක් වූ පාරිතෝෂික විගණිත දින වූ 2024 මැයි 31 තෙක් ගෙවා නොතිබුණි. | මේ සම්බන්ධයෙන් කටයුතු කිරීමට ඔවුන් සම්බන්ධ කරගන්නා ලදි. | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව ඉවත් වූ සේවකයන්ට පාරිතෝෂික ගෙවීම් කළ යුතුය. |
| (ඇ) | 2021 නොවැම්බර් 16 දිනැති අංක පීඊඩී 01/2021 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය මඟින් හඳුන්වා දෙන ලද මෙහෙයුම් අත්පොතේ | | | |
| | (i) 3.2 ඡේදය | කාර්ය මණ්ඩලය සඳහා බඳවා ගැනීම් පටිපාටිය හා ගෙවීම් ව්‍යුහය කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත අනුමැතිය සඳහා යවා නොතිබුණි. | 2024 වර්ෂයේ දී ඉදිරිපත් කිරීමට සටහන් කරගතිමි. | බඳවා ගැනීම් පටිපාටිය හා ගෙවීම් ව්‍යුහය සඳහා අවශ්‍ය අනුමැතීන් ලබා ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ii) 6.6 ඡේදය | මූල්‍ය ප්‍රකාශන සමඟ කෙටුම්පත් වාර්ෂික කාර්යසාධන වාර්තාව ඉදිරිපත් කර නොතිබුණි. | 2024 වර්ෂයේ දී ඉදිරිපත් කිරීමට සටහන් කරගතිමි. | කෙටුම්පත් වාර්ෂික වාර්තාව ගිණුම් සමඟ ඉදිරිපත් කළ යුතුය. |
| (iii) 2021 නොවැම්බර් 16 දිනැති අංක පීඊඩී 01/2021 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය මඟින් හඳුන්වා දෙන ලද රාජ්‍ය ව්‍යවසායන්හි සංයුක්ත පාලනය සඳහා වූ මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.3 ඡේදය | ක්‍රියාකාරී සැලැස්ම සඳහා අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබාගෙන නොතිබුණි. | 2023 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්ම අධ්‍යක්ෂක මණ්ඩලය ඉදිරිපත් කර ඇති අතර 2024 වර්ෂය සඳහා ඉදිරිපත් කර අනුමැතිය ලබා ගැනීමට කටයුතු කරමි. | ක්‍රියාකාරී සැලැස්ම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය අනුමැතිය ලබාගත යුතුය. |
| (ඇ) 2013 සැප්තැම්බර් 11 දිනැති අංක 02/2013 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 3.5 ඡේදය | රු.12,598,899 ක ගෙවිය යුතු පාරිතෝෂික මුදලක් හඳුනාගෙන තිබුණද එම මුදල වෙනම ගිණුමක තැන්පත් කිරීමට කටයුතු කර නොතිබුණි. | රාජ්‍ය පුද්ගලික හවුල් ව්‍යාපාර කටයුතු ආරම්භ වූ පසු පාරිතෝෂික වෙන් කිරීම් වෙනමම ගිණුමක තැම්පත් කිරීමට කටයුතු කරන බව දන්වමි. | ගෙවිය යුතු පාරිතෝෂික ප්‍රතිපාදන මුදල වෙනම ගිණුමක තැන්පත් කිරීම කළ යුතුය. |

**2 මූල්‍ය සමාලෝචනය**

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.295,392 ක අලාභයක් වූ අතර ඊට ප්‍රතිරූපව ඉකුත් වර්ෂයේ ලාභය රු.167,815 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.463,207 ක අඩු වීමක් නිරීක්ෂණය විය. විකිණීමේ හා බෙදා හැරීමේ වියදම් රු.662,410 කින් වැඩි වීම හා ක්ෂය වීම් රු.1,180,070කින් වැඩි වීම මෙම පිරිහීම කෙරෙහි ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

**3 මෙහෙයුම් සමාලෝචනය**

**3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ගිරාඳුරුකෝට්ටේ ගොවිපලේ නිශ්කාර්යව තබා තිබුණු පිරිවැය රු.2,351,000 ක් වූ වාහන 6 ක් අළුත්වැඩියා කර භාවිතයට ගැනීමට හෝ අපහරණයට කටයුතු කර නොතිබුණි. | ගිරාඳුරුකෝට්ටේ ගොවිපලේ වාහන ලේඛනයේ දක්වා ඇති මෙම වාහන 06 න්, අංක 42-1470 දරන වතුර බවුසරය 2013 මැයි 15 දින අළුත්වැඩියාව සඳහා මඩාටුගම වැඩ ඒකකය වෙතද අංක 37-6614 දරන ට්‍රැක්ටරය හා අංක 42-832 දරන ලොරි රථය වෙන්දේසි කිරීම සඳහාද අංක 121-5661 දරන යතුරුපැදිය හා ට්‍රැක්ටර් ටේලරය භාවිතයට ගත නොහැකි ලෙසද ට්‍රැක්ටර් බවුසරය අළුත්වැඩියාව සඳහාද ලෙස වෙන් කර ඇත. | මෙම වාහන අළුත්වැඩියා කර භාවිතයට ගැනීමට හෝ අපහරණය කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | 2019 වර්ෂයේ වත්කම් සත්‍යාපනයේදී භාවිතයට ගත නොහැකි බවට හඳුනාගෙන තිබුණු රු. 9,453,140 ක් වූ ස්ථාවර වත්කම් අපහරණය සඳහා 2024 අප්‍රේල් 05 වන විටද කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. | 2019 වර්ෂයේ වත්කම් ප්‍රත්‍යාගණනයේදී එම වෙන් කර තිබූ වත්කම් ද ප්‍රත්‍යාගණනයකර වත්කම් ලේඛනය සකස් කරන ලද අතර 2022 වර්ෂයේදී නැවත වත්කම් සත්‍යාපනයේදී අබලි ද්‍රව්‍යය හඳුනාගත් අතර එම අබලි ද්‍රව්‍ය 2022 වර්ෂයේ දී ඉවත් කිරීමට කටයුතු කරන ලදි. | අබලි භාණ්ඩ සම්බන්ධ සමීක්ෂණ කමිටු නිර්දේශ පරිදි අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (ඇ) | සමාගමේ සාංගමික සංස්ථා පත්‍රය අනුව අනුදත් ප්‍රාග්ධනය රු. 10 කොටස් 5,000,000 කින් සමන්විත වී තිබුණු අතර, ප්‍රාරම්භක අධ්‍යක්ෂවරුන් වෙත කොටස් 03 ක් පමණක් නිකුත් කර තිබුණද, අනෙකුත් කොටස් 2023 දෙසැම්බර් 31 දින දක්වාම නිකුත් කර නොතිබුණි. | 2024 වර්ෂයේ අප්‍රේල් මස මින් (රංජිත් අමරණාත් ඉබුල්දෙණිය මහතා) කොටසක් D.G.M.A.S.L. නමට මාරු කර ගැනීමට කටයුතු කර ඇත. ඉතිරි කොටස් දෙක පවරා ගැනීමෙන් පසු කොටස් නිකුත් කිරීම සිදුකරන බව දන්වා සිටිමි. | අවශ්‍ය පරිදි කොටස් නිකුත් කිරීමට පියවරගත යුතුය. |
| (ඈ) | ව්‍යාපෘති කමිටුව විසින් තෝරා ගත් බාහිර ආයෝජකයකු සමඟ රාජ්‍ය පෞද්ගලික හවුල් ව්‍යාපාරයක් ලෙස සමාගම ප්‍රතිසංවිධානය කිරීම සඳහා 2018 සැප්තැම්බර් 18 දිනැති අංක අමප/18/2083/803/031 දරන අමාත්‍ය මණ්ඩල තීරණය මගින් අනුමැතිය ලබාදී තිබුණි. ඒ අනුව රාජ්‍ය පෞද්ගලික කළමනාකරණයකට ගිවිසුම්ගතවී ප්‍රතිසංවිධානය කිරීම සඳහා 2022 ජනවාරි 18 දිනැති අංක අමප/21/2229/317/025-1 දරන අමාත්‍ය මණ්ඩල තීරණය මගින් අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබාදී තිබුණද විගණිත දින තෙක් එම කටයුතු අවසන් කර නොතිබුණි. | මෙම බාහිර ආයෝජකයෙකු තෝරාගැනීමේ කාර්යය මුළුමනින්ම සිදු කරනු ලබන්නේ ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය විසිනි | අමාත්‍ය මණ්ඩල තීරණය ප්‍රකාරව රාජ්‍ය පෞද්ගලික කළමණාකරණයකට ගිවිසුම්ගතවී ප්‍රතිසංවිධානය කිරීම සඳහා අවශ්‍ය කටයුතු කළ යුතුය. |
| (ඉ) | පිරිවැය රු.8,156,000 ක් ලෙස දැක්වෙන සමාගම විසින් දැනට භාවිතා කරනු ලබන ශ්‍රී ලංකා මහවැලි අධිකාරියට අයත් වාහන 04 ක් පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි. | මෙම වාහනවල අයිතිය මව් සමාගම සතුව පවතින අතර පරිහරණය කිරීමේ අයිතිය සමාගම් වෙත ලබා දී ඇත. | සමාගමට ලබාදී ඇති වත්කම්වල අයිතිය පවරා ගැනීමට අවශ්‍ය කටයුතු කළයුතුය. |

### 3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| | සමාගමේ සමාලෝචිත වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්ම අනුව කාර්යසාධනය සම්බන්ධයෙන් පහත නිරීක්ෂණ කරනු ලැබේ. | | |
| (i) | පශු සම්පත් අංශය යටතේ ක්‍රියාත්මක බ්‍රොයිලර් මස් නිෂ්පාදනයේ මූල්‍ය ප්‍රගතිය සියයට 11.63ක් හා භෞතික ප්‍රගතිය සියයට 12.25ක් වශයෙන් අඩු මට්ටමක පැවතුණි. එළුවන් ඇති කිරීමේ මූල්‍ය ප්‍රගතිය සියයට 55.2 ක් වුවද, එහි භෞතික ප්‍රගතිය සියයට 41.46 ක් වී තිබුණි. | ජනවාරි සිට ජූලි කාලය සඳහා පිටතින් මස් මිලදී ගෙන අලෙවි කරන ලදි. කාර්තුවකට 1200kg ගැනීමට ඇස්තමේන්තු කළද විකුණුම් අවශ්‍යතාවය මෙම කාර්තු දෙකට 588 kg කි. එළු ඒකකයේ 2023 වර්ෂයට සතුන් අලෙවි කර ඇත්තේ එක් අවස්ථාවක් පමණි. | වෙළෙඳපොල අධ්‍යනය කර ප්‍රායෝගික තත්ත්වයන් සලකා බලා ක්‍රියාකාරී සැලැස්ම පිලියෙල කර ඒ අනුව ස්ථාපිත ඉලක්ක ළඟා කර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ii) | ක්‍රියාකාරී සැලසුම අනුව සමාගම අයිස්ක්‍රීම් ලීටර 3,200 ක් නිපදවීම තුළින් රු.මිලියන 1.19ක ආදායමක් ඉපැයීමට අපේක්ෂා කර තිබුණද ලීටර 548ක් නිපදවීම තුළින් රු. මිලියන 0.31ක ආදායමක් පමණක් උපයාගෙන තිබුණි. | අයිස් ක්‍රීම් නිෂ්පාදන යන්ත්‍රය නැවත අලුත් වැඩියා කළ නොහැකි ලෙස ක්‍රියා විරහිත වී ඇත. දෙවන කාර්තුවෙන් පසු නිෂ්පාදනය නතර වී ඇත. | ප්‍රායෝගික තත්ත්වයන් මත ක්‍රියාකාරී සැලැස්ම පිලියෙල කර ස්ථාපිත ඉලක්ක ළඟා කර ගැනීමට කටයුතු කළ යුතුය. |

### 3.3 නිෂ්කාර්ය හෝ ඌන උපයෝජිත දේපල, පිරියත හා උපකරණ

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ගිරාඳුරුකෝට්ටේ ගොවිපොළ සත්ත්ව පාලන පුහුණු මධ්‍යස්ථානයක් බවට පත් කිරීමේ අරමුණින් ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ "සී" කලාපය විසින් 2014 සහ 2015 වර්ෂවලදී ඉදිකරන ලද ගවගාල්, එළුගාල් ඇතුළු ඉදිකිරීම් හා රු. 9,338,000 ක් වූ භාණ්ඩ 2016 පෙබරවාරි 08 දින සමාගමට පවරාදී තිබුණද මෙම ඉදිකිරීම් ප්‍රයෝජනයට ගැනීම සඳහා නිශ්චිත සැලසුමක් හෝ ක්‍රමවේදයක් ඇති කර නොගැනීම හේතුවෙන්, පවරා දුන් දිනයේ සිට එම වත්කම් නිෂ්කාර්යව පැවතුණි. | වෙනත් පාර්ශවයකගේ අවශ්‍යතාවය මත ඉදිකරන ලද මෙම ගොඩනැගිලි 2016/02/08 වන දින සමාගම වෙත පවරා දුන් අතර ගොඩනැගිලි භාවිතයට ගැනීමට අවශ්‍ය සතුන් මිලදී ගැනීමේ හැකියාවක් සමාගම වෙත නොවූ අතර ඒ හේතුවෙන් අනවශ්‍ය වත්කම් වෙනුවෙන් ක්ෂය වෙන් කිරීමක් සමාගම වෙත පැවරී ඇත. එය අදායම් නොලබන වැය බරක් වී ඇත. | මෙම ඉදිකිරීම් ඵලදායීව ප්‍රයෝජනයට ගැනීමට සුදුසු ක්‍රමවේද සකසා ඒ අනුව කටයුතු කළ යුතුය. |
| (ආ) | ගිරාඳුරුකෝට්ටේ සත්ත්ව ගොවිපොළට අයත් 1986 වර්ෂයේ ඉදිකර තිබුණු ගොඩනැගිලි 7 ක් සම්පූර්ණයෙන් අබලන් තත්ත්වයේ පවතින හෙයින් ප්‍රයෝජනයට ගෙන නොතිබුණි. | මෙම ගොඩනැගිලි 2024 වර්ෂය වත්කම් සත්‍යාපනයේදී හඳුනාගෙන ඉවත් කිරීමට කටයුතු කරමි. නිෂ්පාදනාගාරයේ සියලු අලුත්වැඩියාවන් රාජ්‍ය පුද්ගලික හවුල් ව්‍යාපාරය ඇරඹූ පසු සිදුකිරීමට කටයුතු කරනු ලබන බව දන්වා සිටිමි. | අබලන් ගොඩනැඟිලි පරීක්ෂා කර භාවිතයට ගත නොහැකි නම් අධ්‍යක්ෂ මණ්ඩල තීරණ මත අපහරණයට කටයුතු කළ යුතුය. |